# දේශීය වී ගොවිතැන නගා සිටුවීමට ලන්දේසීන් ලබාදුන් දායකත්වය පිළිබඳ විමර්ශනයකි.

එච්.එච්.එන්.එස්. හේවාවසන්-
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

ශ්‍රී ලංකවට පැමිණි මුල් ආර්ය කණ්ඩායම්වල ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මයයි. මොවුන් වියළි කලාපීය ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශ තම වාසභූමි ලෙස තෝරාගත්තේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබා ගැනීමට ය. දේශීය රාජ්‍ය පාලකයන්ගේ අනුග්‍රහය වී ගොවිතැනට මෙන් ම ඒ හා සබැඳි වාරි කර්මාන්ත ඉදිකිරීමේ කාර්යයට ද නොමදව ලැබිණි. රජරට ශිෂ්ටාචරය බිඳ වැටී, රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමෙන් පසු වාරි කර්මාන්තවලින් ලැබෙන ජලය වෙනුවට අහස් දියෙන් ගොවිතැන් කිරීම ආරම්භ විය.

මුලාශ්‍රගත සාධක අනුව පහළොස් වන සියවස පමණ දක්වා මෙරට පැවතියේ ස්වයංපෝෂිත කෘෂි අර්ථ රටාවකි. එහෙත් යුරෝපීය ආගමනයෙන් පසු දේශීය කෘෂිකර්මයේ පරිහානිය ආරම්භ වූයේ ය.

ප්‍රථමයෙන් ම ලංකාවට පැමිණි යුරෝපීයයන් වූ පෘතුගීසිහු වසර එකසිය පණහකට අධික වූ සිය පාලන කාලය තුළදී වී ගොවිතැන නංවාලීමට කිසිදු උත්සාහයක් නො ගත්හ. ඒ වෙනුවට ඔවුහු ඉබේ වැවුණු කුරුඳු හා අනෙක් කුළු බඩු වර්ග අලෙවිය තුළින් විශාල ආදායමක් ලදහ. එහෙත් ලන්දේසීන් අනුගමනය කළේ මීට වඩා වෙනස් ප්‍රතිපත්තියකි.

1658 සිට 1796 දක්වා ලංකාව පාලනය කළ ලන්දේසිහු කුරුඳු හා සෙසු කුළුබඩු ආශ්‍රිත වෙළඳාම තම මූලික අරමුණ බවට පත් කර ගත්ත ද වී ගොවිතැන නංවාලීමට සඳහා ද යම් පමණක උත්සාහයක් දැරූහ. ඔවුන්ගේ බලකොටුවල ජීවත් වූ පිරිස් මෙන්ම යටත් වැසියන්ට ද, ලස්කිරිඤ්ඤ හමුදාවට ද පරිභෝජනය කිරීම සඳහා විශාල සහල් ප්‍රමාණයක් ආනයනය කිරීමට සිදුවිය. එම මුදල අවම කර ගැනීමට නම් දේශීය වී වගාව දියුණු කළ යුතු විය. එහෙයින් වෙළඳ සමාගම, නටබුන්ව පැවති වාරි කර්මාන්ත පිළිසකර කරමින් දේශීය කෘෂිකර්මය දියුණු කිරීමේ උත්සාහයක නිරත වූයේ ය.

මීගමුවේ සිට වලවේ ගඟ දක්වා වූ සශ්‍රීක කුඹුරුවලින් වැඩි ප්‍රමාණයක් මුඩු බිම් බවට පත්ව තිබිණි. ඇළ වේලි සම්පූර්ණයෙන්ම විනාශව පැවතිණි. එහෙත් මේ කුඹුරුවලින් යම්තාක් දුරකට හෝ ප්‍රයෝජනයට ගැනීමට සමාගම උත්සාහ දැරීය. ලන්දේසීන් ජනතාව අතර ඉඩම් බෙදා දුන්නේ වගා කටයුතුවලට ය. ඒ අනුව ලස්කිරිඤ්ඤ භටයන්ට ද තම ආහාර සඳහා වගා කළ යුතු විය.

අඛණ්ඩව හා අති සාර්ථකව පවත්වාගෙන යා නොහැකි වුව ද විවිධ ලන්දේසි ආණ්ඩුකාරවරුන් යටතේ වී ගොවිතැන නගා සිටුවීම සඳහා ප්‍රයත්න දරනු ලැබීය.

මෙම පර්යේෂණය තුළින් විමසා බැලීමට උත්සාහ දරන්නේ වාණිජ අරමුණු මූලික කොටගත් වෙළඳ පිරිසක් වූ ලන්දේසීන් එම කටයුතු තුළින් ආදායම් උපයන අතර ම තම වියදම අවම කර ගැනීමේ අරමුණින් දේශීය වී ගොවිතැන දියුණු කිරීමට ගත් උත්සාහය පිළිබඳව ය.